**ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන**

# Human Resource Development Programme to take Sri Lankan Schools to 21st Century Education

## 1. හැඳින්වීම

**ඔබ සහභාගි වන මේ වැඩසටහනේ අරමුණු මොනවා ද?**

**ශ්‍රී ලාංකීය පාසල ප්‍රමාද වී හෝ 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම සඳහා පහත සඳහන් පුද්ගල කාණ්ඩ සංවර්ධනය කිරීම**

- පාසල් මට්ටමේ ඉගැන්වීම් කටයුතුවල නියැලෙන **ගුරුවරුන් (Teachers)**,
- පාසල් ගුරුවරුන්ගේ ආරම්භක හා අඛණ්ඩ සංවර්ධනයට (Initial and Continuous Teacher Development) දායක වන **ගුරු අධ්‍යාපනඥයින් (Teacher Educators)**,
- පාසලක අභ්‍යන්තර අධීක්ෂණ කටයුතුවල (Internal Supervision) නියැලෙන **විදුහල්පති (Principal)** ප්‍රධාන **පාසල් කළමනාකරණ කමිටු සාමාජිකයින් (Members of the School Management Committee)**,
- පාසල් මට්ටමේ බාහිර අධීක්ෂණ කටයුතුවලට (External Supervision) සහභාගි වන **විෂය අධ්‍යක්ෂවරුන් (Subject Directors)** හා **ගුරු උපදේශකවරුන් (Inservice Advisors)**,
- පාසල් මට්ටමේ ගුණාත්මක තහවුරුව (School Quality Assurance) සඳහා බාහිර අධීක්ෂණ කටයුතුවල (External School Supervision) නියැලෙන **කොට්ඨාශ, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන නිලධාරීන් (Education Officers at Divisional, Zonal, Provincial and National Levels).**
- පාසල් අධ්‍යාපනය ගැන උනන්දුවන දෙමාපියන්, ශුභ පතන්නන් (Well Wishers) වැනි අය මෙන් ම උපකාරක පන්ති පවත්වන බාහිර පිරිස්.

**අතිරේක අරමුණු**

- 2027 වර්ෂයේ ක්‍රියාවට නැඟීමට නියමිත කණිෂ්ඨ ද්විතීයික මට්ටමේ (ශ්‍රේණි 6-9) විෂයමාලා ප්‍රතිසංස්කරණය ඵලදායි කිරීම
- අධ්‍යාපනය සම්බන්ධව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලියා තිබෙන පොතපත පරිශීලනය සහභාගිවන්නන්ට පහසු කිරීම
- පාසල් අධ්‍යාපනය සම්බන්ධව කතිකාවතක් ගොඩ නැඟීම සඳහා වේදිකාවක් සකස් කිරීම

## 2. විෂයමාලාව හා සම්බන්ධ මූලික කාර්ය මොනවා ද?

- ජාතික අධ්‍යාපන ආයතනය, විභාග දෙපාතර්මේන්තුවේ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාතර්මේන්තුවේ සහාය ඇති ව සිදුකරනු ලබන **විෂයමාලා සංවර්ධනය** (Curriculum Development) හා
- ජා.අ.ආ.යේ බිහි විමත් සමග පාසල් අධ්‍යාපනයේ **පරිපාලන බාහුව** බවට පත් වූ අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපනික ධූරාවලියට (Educational Hierarchy) අයත් ආයතනවල සහාය ලබමින් සිදු කරන **විෂයමාලා ක්‍රියාත්මක කිරීම** (Curriculum Implementation)

**3. පාසල් විෂයමාලා සම්පාදනයට දායක වන ශ්‍රී ලාංකීය අධ්‍යාපන ආයතන මොනවා ද?**

- **ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය** සම්පාදනය සඳහා 1991 අංක 19 දරන පණතින් බිහි වී තිබෙන **ජාතික අධ්‍යාපන කොමිසම** (National Education Commission - NEC)
- 1985 අංක 28 දරන පණතින් බිහි වී තිබෙන **පාසල් අධ්‍යාපනයේ ශාස්ත්‍රීය බාහුව** ලෙස හඳුන්වන **ජාතික අධ්‍යාපන ආයතනය** (National Institute of Education - NIE)
- 1968 අංක 25 දරන විභාග පණතින් (Public Examinations Act) බිහි වී තිබෙන පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ පොදු විභාග සැලසුම් කර ක්‍රියාවට නඟන **ශ්‍රී ලංකා විභාග දෙපාතර්මේන්තුව** (Department of Examinations)
- අධ්‍යාපන අමාත්‍යාංශයේ දෙපාතර්මේන්තුවක් ලෙස ක්‍රියාත්මක වෙමින් පාසල් සිසුන්ට අවශ්‍ය පෙළපොත් සකස් කරන **අධ්‍යාපන ප්‍රකාශන දෙපාතර්මේන්තුව** (Education Publications Department)

**4. ජාතික අධ්‍යාපන කොමිසම පිහිටුවීම නිසා ශක්තිමත් වූ හා දුවර්ල වූ අධ්‍යාපන ක්ෂේත්‍ර මොනවා ද?**

- පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ **පහත සඳහන් තත්ත්ව** පිළිබඳව අධ්‍යයන දියත් කරමින් **පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ජා.අ.ආ. සතුව තිබූ අවස්ථාව යටපත් වීම**
  - (අ) <u>අධ්‍යාපනයට සුවිශේෂ</u> ඉලක්ක (targets), ව්‍යුහය (structure), අන්තගර්තය (content), ක්‍රමවිද්‍යාව (methodology), කායර් සාධනය (performance)
  - (ආ) <u>අධ්‍යාපනය ආශ්‍රිත</u> සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික, පාරිසරික, තාක්ෂණික හා නෛතික තත්ත්ව
- 1990 අංක 20 දරන **තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන පණත** ප්‍රකාරව 1991 වර්ෂයේ බිහිවූ **තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ** මගපෙන්වීම යටතේ **තෘතීයික අධ්‍යාපනය (Tertiary Education) යනුවෙන්** හැඳින්වෙන **තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය** (Technical and Vocational Education) **අපේක්ෂිත පරිදි ආරම්භ වීම**
- මුල් යුගයේ පාසල්වල පැවති **පහළ** බාලාංශ (Lower Kindergarten) **හා ඉහළ** බාලාංශ (Upper Kindergarten) **පන්ති පවත්වා ගෙන යාම කෙරෙහි අවධානය නොදැක්වීම නිසා පෙර පාසල් අධ්‍යාපනය දුවර්ල වීම** (Pre-School Education)
- විධිමත් සොයා බැලීමක් සිදු නොවූ බැවින් 60 දශකයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අභාවයට පත් කළ **ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය** ලබා දෙන **පෞද්ගලික පාසල් යළි හිස එසවීම**

**5. ජාතික අධ්‍යාපන කොමිසමේ උපදෙස් මත සිදු වූ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය කුමක් ද?**

1998 වර්ෂය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ සීමිත මට්ටමින් ක්‍රියාත්මක කර (Limited Implementation), 1999 වර්ෂයේ සිට දීප ව්‍යාප්තව ක්‍රියාක්මක කිරීම ඇරඹූ 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය

**6. 90 දශකයේ ප්‍රතිසංස්කරණ ආරම්භ වන තුරු විෂයමාලා සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්‍රමය යොදා ගෙන තිබූ අරමුණු ආකෘතිය (Objectives Model) ඔබ හඳුන්වන්නේ කෙසේ ද?**

- පහත සඳහන් ක්ෂේත්‍ර තුන යටතේ විෂය අරමුණු ප්‍රකාශයට පත් කළ ආකෘතියක් ලෙස
  - දැනුම (Knowledge),
  - ආකල්ප (Attitudes) හා

- කුසලතා (Skills).

7. මේ ආකෘතිය යටතේ විෂය අරමුණු වර්ගීකරණයට ලක් ව තිබුණේ කෙසේ ද?
   - දැනුම ඉලක්ක කර ගත් ප්‍රජානන ක්ෂේත්‍රයේ (Cognitive Domain) අරමුණු,
   - ආකල්ප ඉලක්ක කර ගත් ආවේදණික ක්ෂේත්‍රයේ (Affective Domain) අරමුණු හා
   - කුසලතා ඉලක්ක කර ගත් මනොචාලක ක්ෂේත්‍රයේ (Psychomotor Domain) අරමුණු.

8. කාලයත් සමග මෙම ආකෘතිය මතු කළ අයහපත් තත්ත්ව මොනවා ද?
   - ඉගෙනුම දැනුමට සීමා කරමින්, විභාග ජය ගැනීම ඉලක්ක කර ක්‍රියාත්මක වන **දැනුම පවරා දීමේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක්** බිහි වීම
   - පහත සඳහන් **තෙයාකාර වූ ඉගෙනුම්ලාභීන්ගෙන්** පළමු කාණ්ඩයේ සාර්ථකත්වය පමණක් තහවුරු කරන පාසල් අධ්‍යාපන ක්‍රමයක් ඇති වීම
     - අසා ඉගෙනගන්නා සිසුන් (Auditory Learners)
     - දැක ඉගෙනගන්නා සිසුන් (Visual Learners)
     - ක්‍රියාවෙන් ඉගෙනගන්නා සිසුන් (Tactile Learners, Kinesthetic Learners)
   - ක්‍රියාවෙන් ඉගෙනීම ප්‍රිය කරන දකුණු මොළය සංවර්ධිත දරුවන්ට පාසල් අධ්‍යාපනයෙන් නිස පල ලබා ගත නොහැකි වීම
   - පිරිමි ළමුන් බහුතරයකට පාසල එපා වීමෙන් ඒ අය පාසල් එවීම දෙමාපියන්ටත්, පාසලේ රඳවා ගැනීම ගුරු විදුහල්පති පිරිස්වලටත් අපහසු වීම

9. ජාතික අධ්‍යාපන කොමිසමේ උපදෙස් මත 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය තෝරා ගත් ඉගෙනුම් අරමුණු (Learning Objectives) මොනවා ද?
   - ඒ ඒ විෂයයේ අන්තගර්තය, දැනුම, ආකල්ප හා කුසලතා ලෙස විභේදනය කරමින් ආරම්භයේ සිට ම පැවති, විෂය අරමුණු (Subject Objectives) හා
   - සියලු ම විෂයයන්ට පොදුවූ දැනුම්, ආකල්ප හා කුසලතා ඒකරාශි කරමින් සකස් වන මූලික නිපුණතා (Basic Competencies)

10. 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය හඳුන්වා දුන් මූලික නිපුණතා ඉහත සඳහන් විෂය අරමුණුවලින් වෙනස් වන්නේ කෙසේ ද?
    - විෂයමාලාවක ඒ ඒ විෂයය අනුව විෂය අරමුණු වෙනස් වෙයි.
    - එහෙත් මූලික නිපුණතා විෂයමාලාවේ සියලු ම විෂයයන්ට පොදුවේ ක්‍රියාත්මක වෙයි.

11. 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය ප්‍රකාශයට පත් කළ **මූලික නිපුණතා** මොනවා ද?
    - සන්නිවේදන නිපුණතා (Competencies related to Communication)
    - පරිසරය ආශ්‍රිත නිපුණතා (Competencies Related to Environment) - ස්වභාවික පරිසරය (Natural Environment), සමාජයීය පරිසරය (Social Environment) හා මිනිසා විසින් නිමවීත කෘතිම පරිසරය (Man made Artificial Environment)
    - ආගම හා සදාචාරය පිළිබඳ නිපුණතා (Competencies related to Religion and Ethics)

- විවේකය හා ක්‍රීඩාව පිළිබඳ නිපුණතා (Competencies related to Leisure and Play)
- ඉගෙනුම සඳහා ඉගෙනීම පිළිබඳ නිපුණතා (Competencies related to Learning to Learn)

12. 2007 විෂයමාලා ප්‍රතිසංස්කරණය, එහි සුවිශේෂ ලක්ෂණ ඇසුරින් ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?
    - නිපුණතා පාදක (Competency Based),
    - ක්‍රියාකාරකම් අභිමුඛ (Activity Oriented),
    - ශිෂ්‍ය කේන්ද්‍රීය (Student Centred) ප්‍රයත්නයක් ලෙස.

13. 2007 විෂයමාලා ප්‍රතිසංස්කරණය ඉගෙනුම් අරමුණු විග්‍රහ කළේ කෙසේ ද?
    - විෂයමාලාවක ඒ ඒ විෂයයට සුවිශේෂ විෂය නිපුණතා (Subject Competencies) හා
    - විෂයමාලාවක සියලු ම විෂයයන්ට පොදු, පොදු නිපුණතා (Generic Competencies) ලෙස

14. විෂයමාලා සැලසුම්කරණ ක්‍රියාවලිය මුල් යුගයේ පැවති අරමුණු ආකෘතියෙන් (Objectives Model), නිපුණතා පාදක ආකෘතියකට (Competency-based Model) පරිවර්තනය වූයේ කෙසේ ද?
    - දැනුම, ආකල්ප හා කුසලතා වෙන් වෙන් ව සැලකිල්ලට ලක් කරමින් විෂය අරමුණු ඉදිරිපත් කිරීම වෙනුවට මේවා ඒකාබද්ධ කරමින් විෂය නිපුණතා (Subject Competencies) ගොඩනැඟීම
    - විෂයමාලාවේ සියලු ම විෂයයන්ට පොදු වූ, පොදු නිපුණතා (Generic Competencies) ගොඩනැඟීම
    - මෙසේ ගොඩ නඟන ලද විෂය නිපුණතා, පොදු නිපුණතා ද සමග ඉදිරිපත් කිරීම

15. සමෝධානික පෞරුෂයක මූලික කොටස් ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?
    - සෞඛ්‍යය (Health), පෝෂණය (Nutrition) හා ශාරීරික සුවතාව (Physical Fitness) මුල් කර සිදු වන **කායික සංවර්ධනය** (Physical Development),
    - විෂය නිපුණතා සංවර්ධනයෙන් ඇති වන **බුද්ධිමය සංවර්ධනය** (Intellectual Development),
    - පොදු නිපුණතා සංවර්ධනයෙන් ඇති වන **සමාජ සංවර්ධනය** (Social Development) හා **පුද්ගල සංවර්ධනය** (Personal Development)

16. සමාජ කුසලතා, පුද්ගල කුසලතාවලින් වෙනස් වන්නේ කෙසේ ද?
    - කණ්ඩායම් තුළ කටයුතු කිරීමේ දී **පුද්ගලයින් අතර ගොඩ නැඟෙන කුසලතා, සමාජ කුසලතා (Social Skills)** හෙවත් **අන්තර් පුද්ගල කුසලතා (Inter Personal Skills)** වෙයි.
    - ස්වාධීනව කටයුතු කිරීමේ දී **පුද්ගලයින් තුළ ගොඩ නැඟෙන කුසලතා, පුද්ගල කුසලතා (Personal Skills)** හෙවත් **අන්තඃ පුද්ගල කුසලතා (Intra Personal Skills)** වෙයි.

17. සුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් සමාජ කුසලතා හඳුන්වා දෙන්නේ කෙසේ ද?
    - සහයෝගය (Co-operation)
    - සහභාගිත්වය (Collaboration)
    - අන්‍යයන් කෙරෙහි සැළකිලිමත් වීම (Caring)
    - අනුන් සමග බෙදා හදා ගැනීම (Sharing)
    - සහානුභූති සවන් දීම (Empathetic Listening)

- සන්නිවේදනය (Communication)
    - පණිවිඩ ලබා ගැනීම (Receiving Messages)
    - පණිවිඩ ලබා දීම (Giving Messages)
- නායකත්වය හා අනුගාමිකත්වය (Leadership and Followership)
- සාකච්ඡාව හා එකඟතාවට පැමිණීම (Negotiation and Consensus Building)

18. සුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් පුද්ගල කුසලතා හඳුන්වා දෙන්නේ කෙසේ ද?
    - චිත්තවේග තුලනය කර ගැනීම
    - ක්ලමත තත්ත්වයන් කළමනාකරණය කර ගැනීම
    - ආරම්භනය
    - වෙනස්වීම් සඳහා දිශාභිමුඛ වීම
    - ව්‍යවසායකත්වය
    - වගකීම හා වගවීම
    - කැපවීම
    - ස්වයං විනය
    - දරා ගැනීමේ හැකියාව

19. සිසුන් තුළ චින්තන හැකියා සංවර්ධනය තහවුරු කිරීම සඳහා 2007 විෂයමාලා ප්‍රතිසංස්කරණය කටයුතු කර ඇත්තේ කෙසේ ද?
    - සිසුන් චින්තනයට යොමු කරන ශිෂ්‍ය කේන්ද්‍රීය (Student Centred), නිපුණතා පාදක (Competency-Based), ක්‍රියාකාරකම් අභිමුඛ (Activity-Oriented) ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන්
    - පුද්ගල සංවර්ධනය යටතේ වගර් කර තිබෙන චින්තන හැකියා එම කාණ්ඩයෙන් ඉවත් කර වෙනත් කාණ්ඩයක් යටතේ ඉදිරිපත් කිරීමෙන්
    - සියලු ම ක්‍රියාකාරකම්වලට පොදුවේ තක්සේරුව හා ඇගයීම ශක්තිමත් කිරීමෙන්

20. සුදුසු නිදසුන් ඇසුරින් චින්තන කුසලතා හඳුන්වා දෙන්නේ කෙසේ ද?
    - නිමර්ාණශීලි චින්තනය
    - විචාරශීලි චින්තනය
    - විශ්ලේෂණාතමක චින්තනය
    - තකර්ානුකූල චින්තනය
    - උද්ගාමී චින්තනය
    - නිගාමී චින්තනය
    - තීරණ ගැනීම
    - ගැටලු විසඳීම
    - ගැටුම් කළමනාකරණය

21. විවිධ යුගවලට සරිලන පරිදි විෂයමාලා අරමුණු විකාශය වූ ආකාරය  ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද?

- අරමුණු ආකෘතිය
- නිපුණතා ආකෘතිය
- ප්‍රමිති පාදක ආකෘතිය
- ඉගෙනුම් පල පාදක ආකෘතිය

22. හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් යනුවෙන් ඔබ තේරුම් ගෙන ඇත්තේ කුමක් ද?

23. ජාතික අධ්‍යාපන කොමිසමේ පළමු වාතර්‍ාවට අනුව සිසුන් වඩවා ගත යුතු වූ අරමුණු අට කවරේ ද?

- බහුවිධ සමාජයක ශ්‍රී ලාංකීය අනන්‍යතාව සුරැකීම
- සංස්කෘතික උරුමය රැක ගැනීම
- සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රීය දිවි පැවැත්ම